// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1996/44 - 2016 දෙසැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2016.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රුවන්වැල්ල ජල සම්පාදන ක්‍රමයේ ඝණ මීටර් 450 ක ධාරිතාවයකින් යුත් ජල ගබඩා ටැංකියට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 01 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1199.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලාවල - 100B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාවල ගමේ පිහිටි පිටර්හිල් ස්ටේට් නැමති ඉඩමෙන්, සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10.3 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | බී. ධර්මලතා මිය හිමිකම් කියන පිටර්හිල් වත්ත හා ප්‍රාදේශීය සභා පාර ; |
| *නැගෙනහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | කේ. කේ. අමරසිංහ හිමිකම් කියන පිටර්හිල් වත්ත හා එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | බී. ධර්මලතා මිය හිමිකම් කියන පිටර්හිල් වත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. බී. ධර්මලතා මිය,
දහම්සිරි මාවත,
සියඹලාවල,
ඉඹුලාන.

12 - 962

1A - G 24707 — 18 (2016/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*